# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2049/4 - 2017 දෙසැම්බර් මස 11 වැනි සඳුදා - 2017.12.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**සුරාබදු ආඥාපනත**

අංක 1004 දරන සුරාබදු නිවේදනය

වාර්ෂික මත්පැන් බලපත්‍ර ගාස්තු

කලින් කලට සංශෝධනය කරන ලද පරිදි සුරාබදු ආඥාපනතේ (52 වැනි අධිකාරිය වූ) 32 වැනි වගන්තිය සමග කියවිය යුතු 25 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය, මංගල සමරවීර වන මා විසින් මෙම නිවේදනය මගින් 2016 දෙසැම්බර් මස 15 දිනැති අංක 1997/16 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද අංක 992 දරන සුරාබදු නිවේදනයේ 1 වන උපලේඛනය 2018 ජනවාරි 01 වන දින සිට ක්‍රියාත්මක වන ලෙස පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ.

2016 දෙසැම්බර් 20 දිනැති අංක 1998/7 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක 994 දරන සුරාබදු නිවේදනය මෙයින් පරිච්ඡින්න කරමි.

**උපලේඛනය 1**

| | *I වැනි තීරය* | *II වැනි තීරය* | |
|---|---|---|---|
| | *බලපත්‍රයේ ස්වභාවය හෝ විස්තරය* | *වාර්ෂික බලපත්‍ර ගාස්තුව රුපියල්* | *ඇපය රුපියල්* |
| 1 | ස්කාගාර බලපත්‍රය | | |
| | (i) ස්කාගාර බලපත්‍රය (තල් අරක්කු හැර) | 1,000,000 | 25,000 |
| | (ii) ස්කාගාර බලපත්‍රය (තල් අරක්කු) | 250,000 | 25,000 |
| 2 | නිෂ්පාදකයින්ගේ තොග වෙළඳ අරක්කු/බියර්/විදේශීය මත්පැන් බෙදාහැරීමේ බලපත්‍රය | 1,000,000 | 50,000 |
| 3 | රා බෝතල්ගත කිරීමේ බලපත්‍රය | 1,000,000 | - |
| 4 | විනාකිරි නිෂ්පාදනාගාර බලපත්‍රය | 500,000 | - |
| 5 | මත්පැන් සඳහා තොග වෙළඳ බලපත්‍රය (ර.බී. 3) | 1,000,000 | 50,000 (අරක්කු සඳහා පමණක්) |


1A - PG 3815 — 582 (2017/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනය I (සම්බන්ධිතයි)

| | I වැනි තීරය | II වැනි තීරය | |
|---|---|---|---|
| | බලපත්‍රයේ ස්වභාවය හෝ විස්තරය | වාර්ෂික බලපත්‍ර ගාස්තුව රුපියල් | ඇපය රුපියල් |
| 6 | මත්පැන් සඳහා සිල්ලර බලපත්‍රය (ර.බී. 4) | | |
| | i. මහ නගර සභා ප්‍රදේශ | 600,000 | 25,000 |
| | ii. නගර සභා ප්‍රදේශ | 400,000 | 25,000 |
| | iii. අනෙකුත් ප්‍රදේශ | 300,000 | 25,000 |
| | iv. ඉල්ලුම්කාර ව්‍යාපාරයේ/සමාගමේ හෝ එහි මව් ව්‍යාපාරයේ/සමාගමේ වාර්ෂික පිරිවැටුම රුපියල් දසලක්ෂ 72 ඉක්මවන වෙළඳ සංකීර්ණ/වෙළඳසැල් වැනි ආයතන සඳහා ඒවා පිහිටි ප්‍රදේශ නොසලකා දෙනු ලබන මත්පැන් සිල්ලරට විකිණීමේ බලපත්‍රය | 1,000,000 | 25,000 |
| 7 | හෝටල් බලපත්‍රය (ර.බී. 7) සංචාරක මණ්ඩලය අනුමත කරනු ලැබූ සහ සංචාරක මණ්ඩල අනුමැතිය රහිත හෝටල් කාමර 05 හෝ ඊට වැඩි | | |
| | (i) කාමර 200 ක් හෝ ඊට වැඩි | 500,000 | 25,000 |
| | (ii) කාමර 20 සිට 199 දක්වා | 250,000 | 25,000 |
| | (iii) කාමර 20 ට අඩු | 100,000 | 25,000 |
| 8 | හෝටල් පීඨිකා බලපත්‍රය (ර.බී. 8) | 100,000 | - |
| 9 | විකුණන වේලාවන් දීර්ඝ කිරීමට අතිරේක බලපත්‍රය (සතියකට) (ර.බී. 15) | 25,000 | - |
| 10 | භෝජනාගාර බලපත්‍රය (සංචාරක මණ්ඩලය අනුමැතිය සහිත/අනුමැතිය රහිත) (ර.බී. 11) | 250,000 | 25,000 |
| 11 | සම්භාෂණ හා විනෝද කාර්යයන් සඳහා වන සමාජශාලා, ක්‍රීඩා සමාජ හා සාමාජිකයින් සඳහා පමණක් වන සමාජශාලා සඳහා වූ බලපත්‍රය (ර.බී. 13 ඒ) | 250,000 | 25,000 |
| 12 | හිමිකාර සමාජශාලා බලපත්‍රය (ර.බී. 13) | 500,000 | 25,000 |
| 13 | තානායම් බලපත්‍රය (ර.බී. 12) | 100,000 | 25,000 |
| 14 | සිනමා සඳහා විනෝද පීඨිකා බලපත්‍රය (ර.බී. 9) | 50,000 | 25,000 |
| 15 | (i) බියර්, ඒල්, ස්ටවුට් හා වයින් විකිණීම සඳහා විශේෂ බලපත්‍රය (සිල්ලරට විකිණීම) (ර.බී. 22 ඒ) | 100,000 | 25,000 |
| | (ii) ස්ථානීය පරිභෝජනය (ර.බී. 22 බී) (සංචාරක මණ්ඩල අනුමැතිය සහිත/ අනුමැතිය රහිත) | 150,000 | 25,000 |
| 16 | වතු ආපනශාලා | 25,000 | 25,000 |
| 17 | රා එකතු කිරීමේ ස්ථාන බලපත්‍රය | 25,000 | - |
| 18 | දුම්රිය භෝජනාගාර (ර.බී. 10) | 25,000 | 25,000 |
| 19 | පරිපාක ස්ප්‍රීතු විකිණීම (ර.බී. 17)/ඊතයිල් මද්‍යසාර විකිණීම | 50,000 | 25,000 |
| 20 | බෝතල් කිරීමට බලපත්‍රය | 50,000 | - |
| 21 | ගබඩා සහ ගුදම් බලපත්‍රය | 50,000 | - |
| 22 | අවස්ථා බලපත්‍රය (දිනකට) (ර.බී. 14) | 25,000 | - |
| 23 | වෙන්දේසිකරුවන්ගේ බලපත්‍රය (දිනකට) (ර.බී. 16) | 50,000 | - |
| 24 | පානීය නොවන ස්ප්‍රීතු ආනයනය හා ළඟ තබා ගැනීම සඳහා දෙනු ලබන බලපත්‍රය | 50,000 | - |
| 25 | කිරිපොත්සා හෝ වයින් නිෂ්පාදනය, බෝතල්ගත කිරීම සහ විකිණීම සඳහා දෙන බලපත්‍රය | 5,000 | - |
| 26 | ඕනෑම තාල වර්ගයේ ගසකින් ලබා ගන්නා ස්වභාවික ද්‍රව්‍ය හෝ වෙනත් පැළෑටිවලින් හෝ ආසවනය කිරීම හැර වෙනත් ක්‍රියාවලියකින් රා හැරෙන්නට ධාන්‍යවලින් සෑදූ මද්‍යසාර 4% පරිමාවට වඩා අඩංගු නොවන මත්පැන් නිෂ්පාදනය කිරීමට දෙන බලපත්‍රය | 5,000 | - |
| 27 | ඕනෑම තාල වර්ගයේ ගසකින් ලබා ගන්නා ස්වභාවික ද්‍රව්‍ය හෝ වෙනත් පැළෑටිවලින් හෝ ආසවනය කිරීම හැර වෙනත් ක්‍රියාවලියකින් රා හැරෙන්නට ධාන්‍යවලින් සෑදූ මද්‍යසාර 4% පරිමාවට වඩා අඩංගු මත්පැන් නිෂ්පාදනය කිරීමට දෙන බලපත්‍රය | 5,000 | - |

උපලේඛනය I (සම්බන්ධිතයි)

| I වැනි තීරය | II වැනි තීරය | |
|---|---|---|
| බලපත්‍රයේ ස්වභාවය හෝ විස්තරය | වාර්ෂික බලපත්‍ර ගාස්තුව රුපියල් | ඇපය රුපියල් |
| 28 ටී සයිඩර් නිෂ්පාදනය සඳහා දෙන බලපත්‍රය | 5,000 | - |
| 29 ඖෂධීය ස්ප්‍රීතු විකිණීම (ර.බී. 18) | 5,000 | - |
| 30 වයින් ස්ප්‍රීතු විකිණීම | 5,000 | - |
| 31 මත්පැන් අපනයනය සඳහා බලපත්‍රය | 10,000 | - |
| 32 රට බීම බලපත්‍ර සමග නිකුත් කරනු ලබන AFL 1, AFL 2, AFL 3, AFL 4 (අරක්කු බලපත්‍ර) | 20,000 | - |
| 33 බෝතල් රා විකිණීම සඳහා නිකුත් කරනු ලබන බලපත්‍රය | 10,000 | - |

| | බලපත්‍රයේ ස්වභාවය හෝ විස්තරය | බලපත්‍ර ගාස්තුව |
|---|---|---|
| 34 | තොග වශයෙන් පදම් කළ අරක්කු නිෂ්පාදනය සහ විකිණීම සඳහා සහ/හෝ නිෂ්පාදනය සහ තොග වෙළඳසැල්වලට නිකුත් කිරීම සඳහා දෙන බලපත්‍රය | රු. 500,000 අවමයකට යටත්ව දනට පවත්නා වර්ෂයේ අගොස්තු 31 වැනි දිනට අවසන් වන පිළිවෙලට යෙදුනු මාස දොළහක කාලපරිච්ඡේදය තුළ බලපත්‍ර ස්ථානයේ අරක්කු විකිණීම/නිකුත් කිරීම පදනම මත ගණනය කොට බලපත්‍රයේ කාලපරිච්ඡේදය තුළ ස්ථානයේ ඇස්තමේන්තු කළ අරක්කු විකිණීම හෝ නිකුත් කිරීම තොග ලීටරයකට රු. 1 බැගිනි. |
| 35 | තොග වශයෙන් ඉක්ෂුපාක අරක්කු නිෂ්පාදනය සහ විකිණීම සඳහා සහ/හෝ නිෂ්පාදනය සහ තොග වෙළඳසැල්වලට නිකුත් කිරීම සඳහා දෙන බලපත්‍රය | |
| 36 | තොග වශයෙන් විශේෂ අරක්කු නිෂ්පාදනය සහ විකිණීම සඳහා සහ/හෝ නිෂ්පාදනය සහ තොග වෙළඳසැල්වලට නිකුත් කිරීම සඳහා දෙන බලපත්‍රය | |
| 37 | තොග වශයෙන් පොල් අරක්කු නිෂ්පාදනය සහ විකිණීම සඳහා සහ/හෝ නිෂ්පාදනය සහ තොග වෙළඳසැල්වලට නිකුත් කිරීම සඳහා දෙන බලපත්‍රය | |
| 38 | තොග වශයෙන් මෙරට සෑදූ විදේශ මත්පැන් නිෂ්පාදනය සහ විකිණීම සඳහා සහ/හෝ නිෂ්පාදනය සහ තොග වෙළඳසැල්වලට නිකුත් කිරීම සඳහා දෙන බලපත්‍රය | |
| 39 | තොග වශයෙන් ධාන්‍ය මත්පැන් නිෂ්පාදනය සහ විකිණීම සඳහා සහ/හෝ නිෂ්පාදනය සහ තොග වෙළඳසැල්වලට නිකුත් කිරීම සඳහා දෙන බලපත්‍රය | රු. 500,000 අවමයකට යටත්ව දනට පවත්නා වර්ෂයේ අගොස්තු 31 වැනි දිනට අවසන් වන පිළිවෙලට යෙදුනු මාස දොළහක කාලපරිච්ඡේදය තුළ බලපත්‍ර ස්ථානයේ ධාන්‍ය මත්පැන් විකිණීම/නිකුත් කිරීම පදනම මත ගණනය කොට බලපත්‍රයේ කාලපරිච්ඡේදය තුළ ස්ථානයේ ඇස්තමේන්තු කළ අරක්කු විකිණීම හෝ නිකුත් කිරීම තොග ලීටරයකට රු. 1 බැගිනි. |
| 40 | තොග වශයෙන් තල් අරක්කු නිෂ්පාදනය සහ විකිණීම සඳහා සහ/හෝ නිෂ්පාදනය සහ තොග වෙළඳසැල්වලට නිකුත් කිරීම සඳහා දෙන බලපත්‍රය | රු. 100,000 අවමයකට යටත්ව දනට පවත්නා වර්ෂයේ අගොස්තු 31 වැනි දිනට අවසන් වන පිළිවෙලට යෙදුනු මාස දොළහක කාලපරිච්ඡේදය තුළ බලපත්‍ර ස්ථානයේ අරක්කු විකිණීම/නිකුත් කිරීම පදනම මත ගණනය කොට බලපත්‍රයේ කාලපරිච්ඡේදය තුළ ස්ථානයේ ඇස්තමේන්තු කළ අරක්කු විකිණීම හෝ නිකුත් කිරීම තොග ලීටරයකට රු. 1 බැගිනි. |

මංගල සමරවීර,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය

2017 දෙසැම්බර් මස 11 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ දී ය.

12 - 945

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.